සත්‍යය හා නිරවද්‍යභාවය යනු මාධ්‍යකරණයේ මූලික ප්‍රතිපත්තියකි. ඒ නිසාම, සෑමවිටම නිවැරදි නොවන, නොමඟ යවන සුළු හෝ විකෘති කළ තොරතුරු හෝ ඡායාරූප ප්‍රකාශයට පත් නොකිරීමට මාධ්‍ය වග බලා ගත යුතු බව මාධ්‍ය ආචාර ධර්මයන් පවසයි. එහිදී යම් කිසි පුවතක් හා පළ කරනා ඡායාරූප වෙනත් පාර්ශවයක් ඔස්සේ ලබාගන්නේ නම්, එම ඡායාරූප නිවැරදි ඒවා දැයි තහවුරු කරගැනීම අත්‍යාවශ්‍ය වේ.

උදාහරණ ලෙසට, රුසියානු හමුදා විසින් යුක්‍රේනයට ප්‍රහාර එල්ල කිරීමත්, රුසියානු-යුක්‍රේන අර්බුදය පිළිබඳවත් ලබාදී තිබූ මාධ්‍ය ආවරණය පෙන්වා දිය හැක. එහිදී ඇතැම් මාධ්‍ය භාවිතා කර තිබූ ඡායාරූප කෙතරම් නිවැරදිද යන ගැටළුව මතුවිණි.

"රුසියාව පහර දීම අරඹයි, යුක්රේන අර්බුදය ලෝකයම රත් කරයි" යන සිරස්තලයෙන් යුතුව දිවයින පුවත්පතේ (පෙබරවාරි 25, 2022) පළ ව තිබූ ලිපිය ඉන් එකකි. මෙහි වර්තමාන රුසියානු-යුක්‍රේන අර්බුදය හා එහි පසුබිම පිළිබඳව ලියැවී තිබුණු අතර ලිපිය හා පළවී තිබූ ඇතැම් ඡායාරූප, Google reverse image search, Google Lens සහ Tineye ඔස්සේ පරීක්ෂා කර බලන විට පෙනී ගිය කරුණ වූයේ, එම ඡායාරූප වෙනත් පැරණි සිදුවීම් වලට අයත් ඒවා බවයි. එනම්:

රුසියානු-බෙලරුස් ඒකාබද්ධ හමුදා පුහුණු වැඩසටහනක් (2021)

කීයිව් නගරයේ නිදහස් චතුරස්‍රයේ පැවති විරෝධතාවයක් (2014)

කීයිව් නගරයේ නිදහස් චතුරස්‍රයේ පැවති, රජයට එරෙහි විරෝධතාවයක් (2014)

මෙම ලිපිය තුළ, උක්ත කී සිදුවීම් පිළිබඳව සඳහන්ව නොතිබූ අතර, වර්තමාන තත්ත්වයට එම සිදුවීම් වල අදාළත්වයක් ද සඳහන් වී නොතිබුණි. එසේ නම්, ලිපියේ ප්‍රස්තුතයට අදාළ නොවන ඡායාරූප පළ කිරීම පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

ඡායාරූප මූලාශ්‍ර:
https://www.shutterstock.com/.../kiev-ukraine-january-25...
https://www.themoscowtimes.com/.../zapad-2021-what-we...
https://ifex.org/one-journalist-killed-27-others-injured.../